**ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - 2018**

**-----------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයහිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) අධිකාරියේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව කාලපරිච්ඡේදය තුළ අත්පත් කර ගත් දේපල පිරියත හා උපකරණ වටිනාකමෙන් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මඟින් ලබාගත් වටිනාකම හා මුදලින් ගෙවන ලද වටිනාකම වෙන් වෙන්ව දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 06 හි 20 සහ 27 යන ඡේද අනුව හදබිම අධිකාරිය සතුව තිබුණු අලෙවි ව්‍යාපෘතිය 2019 ජනවාරි 23 වන දින“සීමාසහිත හදබිම සමුපකාර සමිතිය" ලෙස ලියාපදිංචි කර තිබුණු නමුත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07</u><br>(i) 42 ඡේදය අනුව ඩබ් පී එල්ප් 8567 දරන ඉෂුසු ලොරි රථය 2018 වර්ෂයේදී රු.3,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද ඒ සඳහා ගිණුම්වල ගැලපීම් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 69 ඡේදයට පටහැනිව 2019 ජුනි මාසය වනවිටත් ඉංගිරියේ පිහිටි අඩක් නිමකරන ලද අලෙවිසැල් ගොඩනැගිල්ල කෙරීගෙන යන වැඩ ගිණුමට හර නොකර ස්ථාවර වත්කම් යටතේ රු.5,568,974 ක් ලෙස ගිණුම් ගතකර 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.642,673 ක් ක්ෂය කර තිබුණි. | වත්කමක් ලෙස හඳුනාගත් බැවින් ගිණුම්ගත කළ බව. | ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිරිවැය රු. 51,854,660 ක් වූ වාහන 16 ක් සමාලෝචිත වර්ෂය තුල රු.47,200,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර, ඒ සඳහා රු. 49,672,134 ක් වූ සමුච්චිත ක්ෂය වටිනාකමින් රු. 48,074,634 ක් ඉවත් කිරීම නිසා රු.1,597,500 ක් සමුච්චිත ක්ෂය ගිණුම වැඩියෙන්ද ප්‍රත්‍යාගණන ගිණුම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රත්‍යාගණනය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) මූල්‍ය වංචා නිසා ලැබිය යුතු රු.1,696,741 ක මුදල එළවළු ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන ගිණුම් තැබිමට කටයුතු කර මේ පිළිබද මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කළ යුතුය.. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1978 වසරේ සිට දිගින් දිගටම පැවත එන රු.1,081,413 ක සංචිත ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු සොයමින් පවතින බව | අදාළ සංචිත පිළිබඳ සොයා බලා එම සංචිත පවත්වාගෙනයාම තවදුරටත් අවශ්‍ය නොවේනම් එම සංචිත ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| **<u>ශ්‍රී ලංකා හදබිම අධිකාරිය</u>** | | | | | |
| ජාතික ඉතිරිකිරිමේ බැංකුව මහනුවර | 1,818,303 | 685,590 | 1,132,713 | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙනස්කම් ඇතිවූ විට වෙනස්වීම් සම්බන්ධ සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| මහජන බැංකුව පේරාදෙණිය | 424,741 | 440,552 | 15,811 | | |
| **<u>අලෙවි ව්‍යාපෘතිය</u>** | | | | | |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පේරාදෙණිය | 1,322,520 | 931,309 | 391,211 | | |
| මහජන බැංකුව පේරාදෙණිය | 500 | 2,058 | 1,558 | | |
| ස්ථාවර තැන්පතු -12 | 6,203,945 | 5,848,889 | 355,056 | පිළිගෙන ඇත. | - එම - |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | රු. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| 11 වැනි පරිච්ඡේදයේ 3.1 උප ඡේදයහා 5 වන පරිච්ඡේදය හා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 2 වන පරිච්ඡේදය. | 1989 වර්ෂයේ සිට පුරප්පාඩු පිරිවීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළනොකර ද්විතියන පදනම මත විධායක අධ්‍යක්ෂවරයා බඳවා ගෙන තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව විධායක අධ්‍යක්ෂවරයාගේ සේවය ලබාගෙන ඇත. | පුරප්පාඩු ප්‍රසිද්ධ කර බඳවා ගැනිමට කටයුතු කළයුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103-110 | සමාලෝචිත වර්ෂය තුළදී රු.158,910 ක් වටිනා කුකුල් පැටවුන් 675 ක් මිය ගොස් තිබු අතර රු.11,300 ක් වටිනා පැළ විනාශ වී තිබුණද එම හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට වගබලා ගන්නා බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 104(2) | අංක පීජී-0134 දරන කැබ් රථය 2018 දෙසැම්බර් 18 දින අනතුරට ලක්වී ඇති අතර එම අලාභය විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව | අදාළ වාර්තා විගණකාධිපති වෙත එවීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 396 | අධිකාරියේ බැංකු ගිණුම් 02 ක මාස 06 සිට වර්ෂ 04 දක්වා කාලයකට පෙර නිකුත් කළ නමුත් 2018 දෙසැම්බර් 31 දින දක්වාත්ගෙවීමට ඉදිරිපත් නොවූ රු.3,358,718 ක් වටිනා චෙක්පත් 603 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු සිදුකරමින් පවතින අතර මුදල් කර නොගත් චෙක්පත් වලට . සිහිකැඳවීම් ලිපි යවා | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,516,879 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.684,322 ක් වූ අතර මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,201,201 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවිසැලේ ලාභය සියයට 80 කින් පහළ වැටීමත් අධිකාරියේ අලාභය සියයට 76 කින් ඉහළයාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 අනුපාත විශ්ලේෂණය

(අ) 2017 වර්ෂයේදී අලෙවිසැලේ ශුද්ධ ලාභ අනුපාතිකය සියයට 3.86 ක් වූ නමුත් 2018 වර්ෂයේදී එම අනුපාතය සියයට 0.80 දක්වා පහළ වැටී තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී ගැනුම්වලට සාපේක්ෂව අපතයෙහි අනුපාතය සියයට 2.9 ක් වූවත් අතර 2018 වර්ෂයේදී එය සියයට 3.6 දක්වා වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝනය

3.1 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලෙවිසැලට හදබිම අධිකාරියෙන් ලැබිය යුතු ණය ශේෂය හා අධිකාරියේ ගිණුම් අනුව අලෙවිසැලට ගෙවිය යුතු ණය ශේෂය අතර වසර 02 ක කාලයක සිට රු. 781,946 ක වෙනසක් තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය. |

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හදබිම අධිකාරියෙන් රු. 54,912,000 ක් ශේෂයක් ලැබිය යුතු ලෙස තිබුණද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එම සභාවට ගෙවිය යුතු | පොත්වලින් කපාහැරීමට අමාත්‍යාංශ නිර්දේශ ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව | නිවැරදි ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශේෂයක් ලෙස නොව ලැබිය යුතු ලෙස රු.2,094,280 ක් දක්වා තිබුණි. | | |
| (ආ) | 2014 සහ 2015 වර්ෂයේදී අලෙවි අංශයේ අලෙවි කටයුතු සඳහා මිලදී නොගත් ගැණුම් සඳහා රු.1,696,741 ක මුදලක් ගෙවා තිබුණු අතර, ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.575,000 ක් අයකර ගෙන අයකර ගත් එම මුදල හදබිම අධිකාරියේ අවසන් ගිණුම්වල අලෙවි අංශයට ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි. අයවිය යුතු සම්පූර්ණ මුදල වූ රු.1,696,741 ක් අලෙවි අංශයේ ණයගැති ශේෂය යටතේ දක්වා තිබූ අතර, වර්ෂ 05 ක් ගත වී තිබුණද අදාළ නිලධාරින්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග හෝ ඉතිරි මුදල අයකර ගැනීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීත්‍යානුකූල කටයුතු හේතුවෙන් ශුද්ධ අගය ගැලපීම් නොකර අයකරන ලද මුදල අධිකාරියේ ගිණුම්වල දක්වා ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව හෙළිදරව් කළ යුතු අතර අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |

3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 වර්ෂයේදී රු. 5,999,835 ක් වැයකර අඩක් නිමකර ඇති අලෙවිසැල පිහිටි ඉඩම පවරා ගැනීමට හා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට පවරා දීමට කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් අරමුණුගත කාර්ය සඳහා යෙදවිමට හෝ අවශ්‍යතාවයක් නොමැතිනම් විධිමත් පරිදි පවරාදීමට හෝ කටයුතු කල යුතුය. |

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් 2019 ජනවාරි 30 දින වන විටත් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව. | මාර්ගෝපදේශයට අනුව සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇසුරුම් ද්‍රව්‍ය සඳහා වෙන් කළ මුදලෙහි සත්‍ය වියදම සියයට 213 ක අසාමාන්‍ය වර්ධනයක් විය. | මිල ඉහළ ගිය බැවින් වියදම ඉහළ ගිය බව. | ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව ඇගයීමට ලක්කර අවශ්‍ය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම
---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආයතන සතුව තිබුණු රු. 156,750,000 ක් වටිනා සහ වටිනාකම ඉදිරිපත් නොවූ ඉඩම් ඒකක 02 ක් සහ ගොඩනැගිල්ලක් විධිමත්ව පවරා නොගෙන අධිකාරිය විසින් දීර්ඝකාලීනව භාවිතයට ගෙන තිබුණි. | තක්සේරු වාර්තා නොලැබී තිබූ අතර තාවකාලික පදනම මත පරිහරණය කරනු ලැබේ. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.4 මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය අතර අධිකාරියේ තනතුරු 08 ක පුරප්පාඩු 11 ක්ද, අලෙවි ව්‍යාපෘතියේ තනතුරු 02 ක පුරප්පාඩු 05 ක්ද පැවති නමුත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලැබීමෙන් පසු බඳවාගැනීම් සිදුකරන බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අලෙවි අංශය සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කිරිමකින් තොරව 2018 වර්ෂය තුළ තනතුරු 03 ක් සඳහා නිලධාරින් 20 ක් බඳවාගෙන තිබුණි. | සමූපකාර සමිතියක් ලෙස ලියාපදිංචි කිරීම හේතුවෙන් ඉදිරියේදී මෙම ගැටළුව ඇති නොවන බව. | නිශ්චිත ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය
--------------------------------------------

4.1 වාර්ෂික වාර්තාව සභාගත කිරීම
-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 6.5.3 ඡේදය පරිදි අවසාන විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, 2015 වර්ෂයේ සිට 2017 දක්වා වාර්තා 2019 වර්ෂයේ අගෝස්තු මස වන විටත් සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015, 2016 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට යොමුකර ඇත. 2017 වර්ෂයේ කෙටුම්පත් වාර්තාවද යොමුකර ඇත. | අදාළ කාලය තුළ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

4.2 අයවැය පාලනය
--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන වියදම් වැය විෂයයන් 6 කට අදාළව සියයට 13 සිට සියයට 109 දක්වා ඇස්තමේන්තු ඉක්මවීම සඳහා අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇති බව | අදාළ අනුමැතියන් ලබාගැනීමට කටයුතු කළයුතුය. |

4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය 7.4.1 ඡේදය පරිදි කළමනාකරණ කමිටු රැස්වීම් 02 පැවැත්වීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී මෙම තත්ත්වය ඇති නොවීමට කටයුතු කරන බව | චක්‍රලේඛය පරිදි කටයුතු කළයුතුය. |

4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව වර්ෂයට අදාළව අධිකාරිය විසින් තිරසාර සංවර්ධන අරමුණු 05ක් සඳහා අවධානය යොමු කර තිබුණ ද ඒ හා සම්බන්ධව ඉලක්ක පාදක දත්ත, ඉලක්ක ලඟාවිය යුතු සංධිස්ථානය මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |